**ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන ඵය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.994,850 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කඩ කාමර 02 ක ලැබිය යුතු එක්වන් මුදල් රු.162,887 ක් ගිණුම් ගතකර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක බිල්පත් පියවීම සඳහා එවා තිබුණු රු.2,953,840 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම්ගත කර තිබුණි. | පිළිගන්නා බව හා එය නිවැරදි කරන බව | -එම- |
| (ඈ) | මධ්‍යම පළාත්, සභාවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ වැටුප් ප්‍රතිපූර්ණය සඳහා ලද මුදල් රු.510,448 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ඉකුත් වර්ෂයේ වාහන බැටරි වටිනාකම් ගිණුම් වලින් අත්හැරීමේ වරද නිවැරදි කිරීමේදී දෝෂ සහගතව ගිණුම් තැබීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා තොග ශේෂය රු.126,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු එකතුව රු.97,580 ක කාර්යාල උපකරණ හා යන්ත්‍ර උපකරන ප්‍රාග්ධනිත කර නොතිබුණි. | පිළිගන්නා බව හා එය නිවැරදි කරන බව | -එම- |

## 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයන් 11 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය අනුරූපි වාර්තා අනුව ශේෂය සමඟ සැසදීමේදී රු.21,302,040 ක නොසැසදීමක් විය. | උප ලේඛනවල දෝෂ සහිත බවක් පවතින අතර උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව | හේතු සොයාගෙන නිවැරදි කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර තිබූණු ආදායම් වියදම් ගිණුමෙහි දැක්වෙන ආදායම් විෂයන් 09 කට අදාල ශේෂයන් සහ ඊට අදාළ උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු.257,300 ක නොසැසදිමක් විය. | 2023 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු බව | ගිණුම් ශේෂ නිවැරදි කල යුතුය |

## 1.6.3 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.2,241,938 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂයේදිත් නිරවුල් කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ශේෂ හදුනාගෙන නිරවුල් කල යුතුය. |

## 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.21,137,791 ක් වූ ගිණුම් ශේෂ 09 කට අදාළ ස්ථාවර වත්කම් ලේඛන, ඔප්පු, ශේෂ සනාථ කිරීම්, ණයගැති ලේඛන සහ උපලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරික්ෂා කල නොහැකි විය. | 2023 වසරේ අවසන් ගිණුම් සැකසීමේදී උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂයන්ට අදාළ ලේඛන, උපලේඛන හා ලිපිගොනු පිළියෙල කල යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **රීති හා අතුරු ව්‍යවස්ථා** | | | |
| | 2015 පෙබරවාරි 02 දිනැති අංක 1900/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ වූ මධ්‍යම පළාත් සභා නිවේදනයේ අංක 02 රීතිය | වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා බිල්පත් ලබාගැනිමකින් තොරව සභිකවරුන්ගේ ඉන්ධන දීමනා ලෙස රු.336,000 ක් ගෙවා තිබුණි. | පිළිගන්නා බව හා ධාවන සටහන් ලබා දුන් මන්ත්‍රීවරුන්ට පමණක් අදාල මාසවලට ඉන්ධන දීමනාව ගෙවූ බව | ගැසට් නිවේදනයේ සඳහන් රීති ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| I. | මුදල් රෙගුලාසි 371(5) | අවස්ථා 07 කදී ලබාදී තිබුණු රු.153,200 ක කල් ඉකුත් වූ අතුරු අග්‍රිම නියාදනය කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| II. | මුදල් රෙගුලාසි 571(3) | කැබ් රථයක් අලුත්වැඩියා කිරිම සඳහා පළාත් පාලන කොමසාරිසේගන් 2016 ජනවාරි 16 දින රු.1,343,710 ක ප්‍රතිපාදන ලැබී තිබුණද අලුත්වැඩියාව නිසි පරිදි ඉටු නොකිරිම හේතුවෙන් අදාළ ආයතනයට මුදල් ගෙවීම අත්හිටුවා ඇති බැවින් ලද මුදල් ආපසු යැවීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | නිවැරදිව අලුත්වැඩියාව සිදුකර නොතිබූ හෙයින් ගෙවීම් කටයුතු සිදුකර නොමැති බව, එම ආයතනය වෙත අදාල අලුත්වැඩියාව නිවැරදි කර දෙන ලෙස ඉල්ලීම් කළද එය මේ දක්වා සිදුව නොමැති බැවින් ගෙවීම් කටයුතු සිදු කර නොමැති බව. | අලුත්වැඩියාවන් කඩිනමින් ඉටු කරවාගෙන නිරවුල් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.871,619 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,526,446 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). වරිපනම් හා බදු | 536,000 | 551,165 | 467,145 | 300,550 | 835,000 | 688,093 | 659,428 | 216,530 |
| (ii). කුලී | 3,902,440 | 1,231,131 | 1,205,735 | 733,551 | 8,915,200 | 2,954,267 | 2,176,393 | 858,766 |
| (iii). බලපත්‍ර ගාස්තු | 328,000 | 67,700 | 67,700 | - | 350,000 | 200,450 | 200,450 | - |
| (iv). වෙනත් ආදායම් | 3,022,300 | 2,527,175 | 2,183,648 | 1,131,910 | 2,296,000 | 1,623,443 | 1,268,470 | 1,201,012 |
| එකතුව | 7,788,740 | 4,377,171 | 3,924,228 | 2,166,011 | 12,396,200 | 5,466,253 | 4,304,741 | 2,276,308 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අයවීමට ඇති හිඟ කඩ කුලිය රු.59,151 ක් වූ අතර ඒ තුළ වූ පැරණි නගරයේ පිහිටි කඩකාමර 05 ක් වෙනුවෙන් වසර 05 කට පෙර සිට ලැබිය යුතු රු.11,400 ක කඩ කාමර කුලී අයකරගෙන නොතිබුණි. | කඩ කාමර කුලී අයකිරිමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

(ආ) වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ බිල්කළ රු.128,970 ක කසළ ගාස්තු ආදායමෙන් රු.16,110 ක් එනම් සියයට 12 ක් රැස්කරගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.281,940 ක කසළ ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් මේවන විට අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව | හිඟ ආදායම් අයකරගත යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.464,482 ක් විය. | සත්‍ය වශයෙන් මෙවැනි ශේෂයක් නොමැති බව හා මේ සම්බන්ධයෙන් පරික්ෂා කර බලා හිඟ ශේෂ ඇතිනම් අයකර ගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු ශේෂ නිරවුල් කරගත යුතුය. |
| (ආ) | 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.70,489 ක කර්මාන්ත ණයහිමි ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල පරිසර ආරක්ෂණ බලපත්‍ර වල වලංගු කාලය ඉක්මවා තිබුණු ව්‍යාපාර 32 ක් බලපත්‍ර නැවත අලුත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.96,000 ක බලපත්‍ර ගාස්තු අයකරගැනිමට නොහැකි වී තිබුණි. එසේම පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර හඳුනාගැනීම සඳහා 2020 වර්ෂයෙන් පසු වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ව්‍යාපාර හඳුනාගැනීම හා සමීක්ෂණ කටයුතු මේ වන විට ක්‍රියාවට නංවා ඇති බව හා කඩිනමින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට කටයුතු කරන බව | සමීක්ෂණය සිදුකර පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තාක්ෂණ නිලධාරි තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර තිබූ නිලධාරියාට වැඩ බැලීමේ දීමනාව ගෙවීමට අමතරව රාජකාරියට වාර්තා කිරීමට ගමන් වියදම් සහ සංයුක්ත දීමනා ලෙස රු.146,101 ගෙවා තිබුණි. | මෙලෙස ලබාගෙන ඇති ගමන වියදම් හා සංයුක්ත දීමනා නැවත ප්‍රාදේශීය සභාවට අයකර ගැනීම සඳහා දඹුල්ල ප්‍රාදේශීය සභා ලේකම් මගින් දැනුවත් කර ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.9,092,144 ක වාහන 03 ක් හා වටිනාකම හඳුනානොගත් වත්කම් ඒකක 09 ක් හා ජෙනරේටරයක් වසර 02 ත් 20 ත් අතර කාල පරාසයක සිට නිෂ්කාර්ය හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ රු.4,000,000 ක ඇස්තමේන්තුවකට අනුව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ඉදිකරමින් පවතින පිටවල සංචාරක මධ්‍යස්ථානයේ බිම් මහල අදාළ ඉදිකිරීමට බිල්පතෙහි සඳහන් වැඩ කොටස් වලින් සියයට 20 ක් පමණක් ඉටුකර තිබියදී හා වැඩ කොටස් අවසන් කර නොතිබියදී තාක්ෂණ නිලධාරිවරයා විසින් වැඩ අවසන් බවට නිර්දේශ කර රු.3,354,894 ක බිල්පත් 2021 දෙසැම්බර් 31 දින පළාත් පාලන දෙපාරත්මේන්තුවට යවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ගිවිසුම්ගත වැඩ කොටස් ඉටු නොකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | එම දිනවල පැවති අමු ද්‍රව්‍ය හිඟතාවය සහ අමුද්‍රව්‍ය වල මිළ ගණන් නිතර වැඩිවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ගැනීමට නොහැකි විය. ලබා දුන් ප්‍රතිපාදන මුදල් රඳවා තබා ගැනීම සඳහා අවසන් බිල්පත් සකස් කර ඉදිරිපත් කළ ද කොන්ත්‍රාත්කරුට කිසිදු ගෙවීමක් සිදු කර නොමැති බව | ඉටුකරන ලද වැඩ සඳහා බිල්පත් සකස් කල යුතු අතර ඉදිකිරීම් අවසන් කරගත යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය සැසදීමේදී තනතුරු 07 කට අදාල නිලධාරීන් 11 දෙනෙකුගේ ඌණතාවයක් පැවතුණි. | මේ සම්බන්ධයෙන් මාසිකව ඉහළ කළමනාකරිත්වය දැනුවත් කිරීමට කටයුතු කරන බව | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය. |
| (ආ) | ස්ථාන මාරු වී පැමිණි සංවර්ධන නිලධාරියෙකු සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 04 සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ක්ෂේත්‍ර පරීක්ෂණ වල නිරතව සිටි දින 108 ක් සම්බන්ධව තහවුරු වන වාර්තා නොතිබුණු අතර එම කාලය තුල අනුමැතියක් රහිතව දින 76 ක් කාර්යාලයෙන් බැහැරට ගොස් තිබුණි. කාර්යාලයේ රාජකාරි කළ දින 14 න් 13 ක්ම කාර්යාලයෙන් පිටවූ වේලාව සටහන් කර පැමිණීමේ ලේඛනයේ අත්සන් තබා නොතිබුණි. මෙම කාලය තුල වැටුප් වශයෙන් රු.443,835 ක් ගෙවා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ පරීක්ෂණයන් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට විශ්‍රාම යෑම, ස්ථාන මාරුවීම සහ වැඩ තහනමට ලක් වූ සේවකයන් 06 දෙනෙකුගෙන් වර්ෂ 11 ත් මාස 10 ත් අතර කාලයක් හිඟව පවතින රු. 503,194 ක ණය ශේෂයක් අය කර ගෙන නොතිබුණි . | ණය මුදල් අයවෙමින් පවතින බව | ණය ශේෂ අයකරගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජනවාරි 12 දිනැති අංක DMA/01-219(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර විගණන හා කළමනාකරණ කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කල යුතු වුවද ඒ චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරි විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත ආදායම් වියදම් තත්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේදී වියදම් විෂයයන් 29 ක සියයට 13 සිට සියයට 659 දක්වා විචලනයන් නිරීක්ෂණය වූ අතර වියදම් විෂයන් 32 ක සියයට 14 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරි කර තිබුණි. තවත් වියදම් විෂයයන් 11 ක ප්‍රතිපාදන සියයට 100 ක් ඉතිරි කර තිබුණි. මේ හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | 2024 අයවැය ලේඛනය සකස් කිරිමේදී අවධානය යොමු කර කටයුතු කරන බව . | අවශ්‍යතාවයන් හඳුනාගෙන අයවැය ලේඛන පිළියෙල කල යුතුය. |